1516

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

---

## 1992 අංක 02 දරන
## වයඹ ජනකලා පදනම ප්‍රඥප්තිය

---

(අනුමත කළ දිනය : 1992.03.13)

වයඹ පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IVඅ කොටසේ පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිළදී ගත හැක.

මිළ : රු. 5.00 තැපැල් ගාස්තුව : රු. 2.00

## 1992 අංක 02 දරන වයඹ ජනකලා පදනම් ප්‍රඥප්තිය

වයඹ පළාතේ පාරම්පරික කලා ශිල්ප ආරක්ෂාකර, වැඩි දියුණු කිරීමේ සහ නව හා දේශීය කර්මාන්ත නංවාලීමේ අරමුණින් වයඹ ජනකලා පදනම ස්ථාපනය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*කෙටිනාමය හා ක්‍රියාත්මක වන දිනය.*

01. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 02 දරන '' වයඹ ජනකලා පදනම '' ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අදාළ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නම් කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය.

*වයඹජනකලා පදනම පිහිටුවීම.*

02. මෙම ප්‍රඥප්තියෙහි මින්මතු '' පදනම '' යනුවෙන් හඳුන්වනු ලබන '' වයඹ ජනකලා පදනම '' යනුවෙන් නම් කෙරෙන පදනමක් පිහිටුවනු ලැබේ.

*පදනම සංස්ථාපිත ආයතනයක් වීම.*

03. ඉහත දෙවන වගන්තියෙන් පදනමට දී ඇති නාමයෙන් එම පදනම අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත ආයතනයක් වියයුතු අතර, එම නාමයෙන් පදනම විසින් නඩු පැවරීමද, පදනමට විරුද්ධව නඩු පවරනු ලැබීමද කරනු ලැබිය හැකිය.

*වයඹ ජනකලා පදනම පිහිටුවීමේ පරමාර්ථ.*

04. දේශීය කලා ශිල්ප, කර්මාන්ත, නැටුම් හා ජන කලාවන් ආරක්ෂා කර ඉදිරි පරම්පරාවන් වෙනුවෙන් පවත්වාගෙන යාමත්, නවීන තාක්ෂණය යටතේ පාරම්පරික හා නව කර්මාන්ත නඟා සිටුවීමත්, ඒ සඳහා අවශ්‍ය වන උපදේශක සේවා ඇතුළු අදාළ වන පහසුකම් සැලැස්වීමත් පදනම පිහිටුවීමේ පරමාර්ථයන් වන්නේය.

*පදනමේ බලතල හා කාර්යයන්.*

05. පදනමෙහි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් බලතල හා කාර්යයන් ඉටුකළ හැකි වන්නේය.

(අ) වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ දේශීය හා පාරම්පරික කලා ශිල්ප, කර්මාන්ත, නැටුම් කලාව හා ජනකලාවන් ආරක්ෂාකර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නේ යැයි හැඟෙන කාර්යයන් සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම.

(ආ) නව කර්මාන්ත වයඹ පළාත තුළ ස්ථාපනය කිරීම, වැඩි දියුණු කිරීම, සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය විය හැකි ආයතන පිහිටුවීම හා උපදේශක සේවා පවත්වාගෙන යාම.

(ඇ) මිලදී ගැනීමෙන් හෝ අන් අයුරකින් යම් නිශ්චල හෝ චංචල දේපලක් සන්තකයට ගැනීම හා දැරීම බද්ද හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, හුවමාරු කිරීම, විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම.

1—පීපී 003649—2,500 (92/09)

(ඇ) පදනමේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම පිණිස ජාත්‍යන්තර විදේශීය හෝ දේශීය සංවිධාන සමඟ හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම, සේවා වන් ලබාගැනීම ආදී කටයුතු සඳහා ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත් මය ගිවිසුම්වලට හෝ සහයෝගීතා ගිවිසුම්වලට එළඹීම.

අමාත්‍යවරයාට උපදෙස් දීම.

06. ඉහත (4) හා (5) වගන්තිවල සඳහන යම් කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් හා විෂය භාර අමාත්‍යවරයා පදනම වෙත යොමු කරනු ලැබිය හැකි වෙනත් කරුණක් සම්බන්ධයෙන් අදාළ විෂය භාර අමාත්‍යවරයාට හා අමාත්‍යවරුන්ට උපදෙස් දීම පදනම සතු වගකීම විය යුත්තේය.

පදනමේ නියෝජ්‍යායතන දෙපාර්තමේන්තු හා අංශ.

07. ස්වකීය කාර්යයන් හරියාකාරව හා ඵලදායි අයුරින් ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සැලකෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, අංශ හෝ නියෝජ්‍යායතන යම් සංඛ්‍යාවක් පනදම විසින් පවත්වාගෙන යා යුතු වන්නේය.

පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය.

08. (අ) පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටිය යුතු අතර, එම මණ්ඩලය නිල සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද, නම් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙකුගෙන්ද සමන්විත විය යුතුය.

(ආ) නිල සාමාජිකයන් තිදෙනා වයඹ පළාතේ ප්‍රධාන ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු, වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම් යන අයගෙන් සමන්විත විය යුතුය.

(ඇ) නම් කරනු ලබන සාමාජිකයන් සිව්දෙනා අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.

නුසුදුසුකම

09. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු පදනමේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුසුකම් නොලබයි.

නම් කළ සාමාජිකයන්ගේ ධූර කාලය.

10. තනතුරු අත්හැර යාමෙන් හෝ නියමිත කාලයට පෙර අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, නම් කරනු ලැබූ සෑම සාමාජිකයෙක්ම අවුරුදු තුනක කාලයකට සිය ධූරය දැරිය හැකිය.

වැඩබලන සාමාජිකයන්.

11. අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සිය ධූරයේ රාජකාරි ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වේනම්, නව වැනි වගන්තියේ නියමයනට යටත්ව ආමාත්‍යවරයා, විසින් එම සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැක.

නමකළ සාමාජිකයින් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම.

12. (1) අමාත්‍යවරයා අමතන ලිපියක් එවා, නම් කළ සාමාජිකයකුට තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(2) එසේ කිරීම අවස්ථානුකූලයයි විෂය භාර අමාත්‍යවරයාට හැඟී යන්නේ නම්, නම් කළ සාමාජිකයකු සිය ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

13. කාලය ඉකුත් වීමෙන් ධුරයෙන් ඉවත් වන සාමාජිකයකු නැවත පත් කරනු ලැබිය හැකිය. සාමාජිකයන් නැවත පත්කිරීම

14. (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හා උප සභාපති පත් කරනු ලැබිය හැකිය. මණ්ඩලයේ සභාපති හා උප සභාපති.

(2) මණ්ඩලයේ රැස්වීමකදී යම් කරුණක් පිළිබඳව නැමැත්ත විමසීමේදී, පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වේනම්, සභාපතිවරයාට තම ඡන්දයට අතිරේකව දෙවන ඡන්දයක් නැතහොත් තීරක ඡන්දයක් හිමි වේ.

15. (1) මණ්ඩලය මසකට අවම වශයෙන් එක් වරක් හෝ රැස්විය යුතුය. මණ්ඩල රැස්වීම

(2) සභාපති හෝ උප සභාපති අවස්ථානුකූලව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල මූලාසනය දැරිය යුතුය.

(3) සෑම මණ්ඩල රැස්වීමක්ම පිළිබඳව ලිඛිත දැන්වීමක එක් එක් සාමාජිකයකුට ම රැස්වීම් දිනට දින 04කට පෙර ලැබෙන්නට සැලැස්විය යුතු අතර එම රැස්වීමේදී කිරීමට නියමිත කාර්යයන් කවරේදැයි නිශ්චිත වශයෙන් එහි සඳහන් විය යුතුය.

(4) මණ්ඩලයේ රැස්වීමක් කැඳවන ලෙස අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකු අත්සන් කර ඉදිරිපත් කරන ලිපියක් මගින් ඉල්ලා සිටියහොත්, සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය.

16. මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් සිව් දෙනෙකු විය යුතුය. මණ්ඩලරැස්වීම සඳහා ගණපූරණය

17. මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිණිස මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව මණ්ඩල විසින් සිය කාර්යය පරිපාටිය සකස් කරගත හැකිය. මණ්ඩල රැස්වීම පරිපාටිය.

18. මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත්කිරීම දෝෂ සහිතය යන හේතු නිසාම පමණක්, මණ්ඩලයේ යම් කිසි ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ බල රහිත යයි නොසැලකිය යුතුය. මණ්ඩලයේ පුරප්පාඩු නිසා එහි කටයුතු බල රහිත නොවන බව

19. අමාත්‍යවරයා විසින් වයඹ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගෙන්ද එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලබන යම් ආකාරයට හා ප්‍රමාණවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය. මණ්ඩලයේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික.

20. (1) පදනමේ පොදු මුද්‍රාව මණ්ඩලයේ ලේකම් භාරයේ තිබිය යුතුය. පදනමේ මුද්‍රාව.

(2) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර, පදනමේ මුද්‍රාව යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක හෝ නොයෙදිය යුතු අතර, අදාළ මණ්ඩල සාමාජිකයින් දෙදෙනා ඔවුන් එම අවස්ථාවේ එහි සිටි බවට සළකුණක් වශයෙන් එම සාධන පත්‍රයෙහි නැතහොත් ලේඛනයෙහි තම අත්සන් යෙදිය යුතුය.

(3) පදනමේ මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලේඛන හෝ පිළිබඳව මණ්ඩලයේ ලේකම් විසින් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

**අමාත්‍යවරයා විසින් මණ්ඩලයට කරනු ලබන නියමයන්.**

21. මණ්ඩලය සවකීය බලතල, කාර්යයන් හා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේදී හා කාර්ය සාධනයේදී අමාත්‍යවරයා විසින් කලින් කලට නිකුත් කළ හැකි පොදු හෝ නිශ්චිත නියමයනට මණ්ඩලය යටත් විනවා මෙන්ම, එම නියමයනට අනුකූලව ක්‍රියා කළ යුතුය.

**මණ්ඩලය විසින් වගකීම්, කාර්යයන් හා බලතල පැවරීම.**

22. (1) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වගකීම්, කාර්යයන් හා බලතල පදනමේ ඕනෑම සාමාජිකයකුට හෝ සේවකයකුට මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකිය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාරක සභා, උප කාරක සභා සහ උපදේශක මණ්ඩල පත් කරනු ලැබියහැකි අතර විශේෂ විෂයයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඕනෑම වගකීමක්, කාර්යයක් හා බලයක් ඒවාට පවරනු ලැබිය හැකිය.

(3) ඉහත (1) හා (2) උප වගන්ති යටතේ බලතල පවරනු ලැබූ අයෙකු හෝ කණ්ඩායමකට, අධ්‍යක්ෂ මණ්ඩලයේ පොදු හෝ නිශ්චිත නියමයනට යටත්ව, තමන් වෙත පැවරනු බලතල, වගකීම් හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතුය.

(4) (අ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි තීරණය කිරීම ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් කළ යුතුය.

(ආ) කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම.

(5) පත් කිරීම, සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය ගැන ක්‍රියා කිරීම.

**පදනමෙහි ප්‍රධාන විධායක නිළධාරියා.**

23. (1) පදනමෙහි ප්‍රධාන විධායක නිළධාරිවශයෙන් මෙම ප්‍රඥප්තියෙහි මින්මතු කළමනාකාර අධ්‍යක්ෂ වරයා වශයෙන් හඳුන්වනු ලබන පූර්ණ කාලීන සේවකයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතුය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් කළමණාකාර අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතුය.

**කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ බලතල හා රාජකාරී.**

24. (1) කළමණාකාර අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ ලේකම් වියයුතු අතර මණ්ඩල රැස්වීම් වලදී ඔහුට ඡන්ද බලය හිමි නොවේ.

(2) පදනමේ එදිනෙදා සියළුම පරිපාලන කටයුතු පිළිබඳව කළමණාකාර අධ්‍යක්ෂවරයා වගකිව යුතුවේ. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව,

(අ) පදනම විසින් සේවයේ යොදවාගෙන ඇති අයගේ කුසලතා වර්ධනය,

(ආ) පදනමේ කාර්යක්ෂමතාවය හා පදනමේ පරමාර්ථ සාක්ෂාත් කිරීමෙහිලා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම.

(ඇ) පදනමේ අරමුණු සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම එකී කටයුතුවලට ඇතුළත් විය යුතුය.

(3) මෙයට අමතරව මණ්ඩලය විසින් කළමනාකාර අධ්‍යක්ෂවරයාට පවරනු ලැබිය හැකි බලතල, කාර්යයන් හා රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය.

පදනමේ අරමුදල.

25. පදනමට අරමුදලක් තිබිය යුතුය.

(අ) පදනමේ ප්‍රයෝජනය උදෙසා පළාත් සභාව විසින් කලින් කලට ලබාදෙනු ලබන මුදල් ;

(ආ) පදනමට පැවරී ඇති බලතල, කාර්යයන් හා රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේ දී කාර්ය සාධනයේ දී පදනමට ලැබෙන සියළු මුදල් හා පරිත්‍යාග පදනමේ අරමුදලට බැර කළ යුතුය.

අරමුදල යෙදවිය හැකි කරුණු.

26. පදනමේ අරමුණු සපුරා ගැනීම පිණිස හෝ මෙම ප්‍රඥප්තිය යටතේ, හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ පැවරී ඇති බලතල, කාර්යයන් රාජකාරි ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කාර්ය සාධනයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි අරමුදල යොදගත හැකිය.

පදනමේ ගිණුම.

27. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන සිය ආදයම හා වියදම් පිළිබඳවත්, වෙනත් සියළු ගණුදෙනු පිළිබඳවත් නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සම්පාදනය කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට හා තීරණය කරනු ලබන තොරතුරු ඇතුළත් කොට සිය ව්‍යාපාරයට අදළව ගිණුම් හා සංඛ්‍යාලේඛන ඇතුළත් වාර්ෂික ප්‍රකාශයක් පිළියෙළ කළ යුතුය.

පදනමේ මුදල් වර්ෂය.

28. පදනමේ මුදල් වර්ෂය ජනවාරි මස පළමුවැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා වේ.

පදනමේ විගණනය.

29. (අ) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් පදනමේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයෙකු ලවා විගණනය කළ යුතුය. මණ්ඩලය විසින් වාර්ෂික ගිණුම් වාර්තාවක් ප්‍රසිද්ධ කළ යුතුය.

(ආ) පදනමේ ගිණුම් විගණනය කිරීමේ කාර්යය උදෙසා ඔහු විසින් දරන වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදලක් පදනමේ අරමුදලින් ඔහුට ගෙවිය යුතුය.

(ඇ) මෙම වගන්තියේ කාර්යය උදෙසා සුදුසුකම් ලත් විගණකවරයා යනුවෙන් අදහස් වනුයේ,

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු වූද, එම ආයතනය විසින් ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්ති සේවයෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූද තැනැත්තකු හෝ ;

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජික යෙකුව සිටින්නේද, එමෙන්ම ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් වේ.

**විගණන වාර්තාව හා පදනමේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව ප්‍රධාන අමාත්‍යවරයාට යැවිය යුතු බව.**

30. විගණනය කරන ලද ගිණුම් වාර්තාව එක් එක් වර්ෂය වෙනුවෙන් ලද විට, එම වාර්තාවට අදළ මුදල් වර්ෂය තුළදී පදනම විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක්ද සමඟ එය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් එම ගිණුම්වලට අදළ මුදල් වර්ෂය ඉකුත්වී දෙළොස් මසක් ඉකුත්වීමට පෙර ඒවා අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය.

**නියෝග**

31. (අ) මෙම ප්‍රඥප්තියේ සිද්ධාන්ත හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, නියම කළයුතුයයි නැතහොත් නියෝග පැනවිය යුතුයයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් කරුණක් ක්‍රියාත්මක කිරීම සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(ආ) අමාත්‍යවරයා විසින සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

(ඇ) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ගැසට් පත්‍රයේ පළවීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය. ඒ අයුරින් අනුමත කරනු නොලැබූ නියෝගයක් වෙතොත් එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කළා සේ සැලකිය යුතු වුවත්, එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියාමාර්ගයක් කෙරෙහි එම අවලංගු වීම බල නොපෑ යුතුය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් මේ අයුරින් අවලංගු වූවා සේ සැලකිය යුත්තේ කවර දිනයක ද යන්න දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

**රීති.**

32. රීති සෑදිය යුතු යයි බලය දෙන ලද හෝ මෙම ප්‍රඥප්තිය මගින් නියම නියම් කර ඇති හෝ කරුණුවලට අදළව, පදනමට රීති සම්පාදනය කළ හැක.

**පදනමේ සේවකයින් රාජ්‍ය සේවකයින් ලෙස සැලකීම.**

33. දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යයන් උදෙසා පදනමේ සියළුම සේවකයින් '' රාජ්‍ය සේවකයින් '' ලෙස සැලකිය යුතුය.

**අර්ථ නිරූපනය.**

34. මෙම ප්‍රඥප්තියෙහි අන්‍ය ආකාරයකින් සඳහන් වුවහොත් මිස,

'' අනුමත බැංකුව '' යන්නෙන් ලංකා බැංකුව සහ මහජන බැංකුවද,

'' අමාත්‍යවරයා '' යන්නෙන් වයඹ පළාත් සභාවේ කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාද,

'' අරමුදල '' යන්නෙන් වයඹ ජනකලා පදනමේ අරමුදලද,

'' ආණ්ඩුකාරවරයා '' යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාද,

'' ප්‍රධාන අමාත්‍යවරයා '' යන්නෙන් වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාද,

'' ප්‍රධාන ලේකම් '' යන්නෙන් වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාද,

' සභාව '' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවද,

අදහස් කෙරේ.